

# ගණිතය

## පළමුවන ශ්‍රේණිය

### තුන්වන වාරය

ගුරු මාර්ගෝපදේශයට අනුව සම්පාදිතයි

**සැකසුම : බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**



# එකතුව 9 තෙක් එකතු කිරීම



## එකතුව සොයමු

**සපයා ගත යුතු දේ-**

ඔබට පහසුවෙන් සපයා ගත හැකි දේවල් තෝරා ගන්න.

- පිරිසිදු කර ගත් කුඩා ගල් කැට 9 ක්
- ඇට වර්ගයකින් 9  ක්
- එකම වර්ගයේ  මල් 9ක් (එකම පාට)
- බෝතල් මූඩි   9ක්
- බොත්තම් 9 ක්
- කුඩා පෙට්ටියක්
- 1සිට 5 තෙක් ලියූ සංඛ්‍යා කාඩ්පත්

| | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |

**ක්‍රියාකාරකම 1**

**දෙමාපියන්ට උපදෙස්-**

- පෙර පාඩමක දී ද්‍රව්‍ය එකතු කිරීම සඳහා කළ ක්‍රියාකාරකම් පිළිබඳ ව සිහිපත් කරමින් දරුවා සමඟ  කතා බහ කරන්න.
- සපයා ගත්  එක  වර්ගයකින්,  ද්‍රව්‍ය 9ක් පෙට්ටියකට දමන්න.
- සංඛ්‍යා කාඩ්පත් මුනින් අතට හරවා මේසය මත තබන්න.
- දරුවාට එයින් එක කාඩ්පතක් ගෙන සංඛ්‍යාව පෙනෙන සේ මේසය මත තැබීමට කියන්න.  එම කාඩ්පතෙහි සඳහන් සංඛ්‍යාවට සමාන ද්‍රව්‍ය සංඛ්‍යාවක් පෙට්ටියෙන් රැගෙන කාඩ්පතට යටින් තැබීමට කියන්න.
- වෙනත් සංඛ්‍යා කාඩ්පතක් ගෙන සංඛ්‍යාව පෙනෙන පරිදි මේසය මත තැබීමට කියන්න.
- පෙර පරිදිම කාඩ්පතෙහි  සඳහන් සංඛ්‍යාවට සමාන ද්‍රව්‍ය ප්‍රමාණය කාඩ්පත යටින් තැබීමට කියන්න.

- කාඩ්පත් යටින් තබන ලද ද්‍රව්‍ය සංඛ්‍යා එකතු කර පිළිතුර ලබා ගන්නා ආකාරය මෙසේ පැහැදිලි කරන්න.




**ක්‍රියාකාරකම 2**

- වෙනත් වර්ගයකින් ද්‍රව්‍ය 9ක් මේ සඳහා යොදා ගන්න.
- ද්‍රව්‍ය 9 පෙට්ටියට දමන්න.
- කාඩ්පත් 5 මුනින් අතට හරවා මේසය මත තබන්න.
- දරුවාට ඉන් එක් කාඩ්පතක් ගෙන මේසය මත තබා එහි සඳහන් සංඛ්‍යාවට සමාන ද්‍රව්‍ය සංඛ්‍යාවක් ගෙන කාඩ්පත යටින් තැබීමට කියන්න.
- තව කාඩ්පතක් ගෙන එහි සඳහන් සංඛ්‍යාවට සමාන ද්‍රව්‍ය සංඛ්‍යාවක් ගෙන කාඩ්පත යටින් තබා ද්‍රව්‍යවල මුළු එකතුව සොයා ඉහත පැහැදිලි කළ ආකාරයට පැවසීමට දරුවාට කියන්න .
- ද්‍රව්‍ය වෙනස් කරමින් ඉහත ක්‍රියාකාරකම්වල සඳහන් කළ ආකාරයට ,එවැනි ක්‍රියාකාරකම්වල කිහිප වාරයක් යෙදෙමින් එකතු කිරීම පිළිබඳ ව අවබෝධය දරුවාට ලබා දෙන්න.

- රූප එකතු කරමින් හිස්තැන්වලට ,ගැළපෙන පිළිතුරු පැවසීමට දරුවාට අවස්ථාව ලබාදෙන්න

3 යි 2 යි එකතුව.යි.........................



4 යි 1 යි එකතුව.යි........................



*1 ශ්‍රේණිය ගණිතය වැඩ පොතේ පිටු අංක 63 ඇති අභ්‍යාස කිරීම සඳහා මඟ පෙන්වන්න.*